# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 14,924/3 — 1970 සැප්තැම්බර් 21 වැනි සඳුද — 1970.9.21

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)

## ආණ්ඩුවේ නිවේදන

අ.ආ.කා.අංකය එන්.128/70

### පරීක්ෂණ කොමිෂන් සභා පනත (393 වන අධිකාරය)

(393 වන අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි 2 වන වගන්තිය යටතේ නිකුත් කොට 1970 අගෝස්තු මස 5 වන දින අංක 14,917/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1970 අගෝස්තු මස 5 වන දින දරන බලපත්‍රය මගින් ඇසෝසියේටඩ් නිව්ස් පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් නමැති සමාගමට හා එකී සමාගම හා සම්බන්ධ වෙනත් සමාගම්වලට හා පුද්ගලයන්ට අදාළ ඇතැම් කරුණු ගැන පරීක්ෂා කොට වාර්තා කිරීම පිණිස පත් කරන ලද කොමිෂන් සභාවෙහි ලේකම් ධුරයෙන් ඉල්ලා අස්වූ රජයේ නීතිඥ පී. ආර්. පී. ඩී. බණ්ඩාරනායක මහතා වෙනුවට එකී කොමිෂන් සභාවෙහි ලේකම් වශයෙන් 1970 සැප්තැම්බර් 9 වන දින සිට ක්‍රියා කිරීමට එකී පනතෙහි 19(1) වන වගන්තිය යටතේ අග්‍රාණ්ඩුකාර උතුමාණන් විසින් ඩී. ඩබ්ලිව්. අබයකෝන් මහතා පත් කරන ලද බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඩී. පී. දයාරත්න,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්‍යාලය,
කොළඹ, 1970 සැප්තැම්බර් 20 වන දින දීය.

9–1088

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### (171 වන අධිකාරය වන) ආහාර පාලන පනත

**නිත්‍යානුකූල හාල් සලාක ප්‍රමාණය වෙනස් කිරීම**

1952 ආහාර පාලන නියෝගවල "ඉ" ශීර්ෂයේ II වෙනි කොටසේ 5 වෙනි නියෝගය හා එකී " ඉ " ශීර්ෂයේ III වෙනි කොටසේ 4(I) වෙනි නියෝගය යටතේ 1970 සැප්තැම්බර් 26 වෙනි දින සිට නැවත දන්වන තුරු—

(1) 1952 ආහාර පාලන නියෝග වලින් නිරූපණය කොට ඇති පරිදි වත්තක පදිංචි, මීට යාකොට ඇති උපලේඛනයේ I වෙනි තීරයේ නිශ්චිතව සඳහන් යම් පන්තියකට අයත් වයස අවුරුද්දකට වැඩි පුද්ගලයකුට විකිණිය යුතු හෝ නිකුත් කළයුතු සතියක හාල් හෝ වී සලාකයද,

(2) සලාක ක්‍රමය බලපවත්නා (වත්තක් නොවන) නාගරිකවූ හෝ නොවූ යම් ප්‍රදේශයක පදිංචි, මීට යාකොට ඇති උපලේඛනයේ I වෙනි තීරයේ නිශ්චිතව සඳහන් යම් පන්තියකට අයත් සලාක පොතක් හිමි කෙනෙකු වන ඒ පන්තියේ වයස අවුරුද්දකට වැඩි යම් කැනැත්තකු වෙත විකිණිය හැකි හෝ නිකුත් කළ හැකි සතියක හාල් හෝ වී සලාකය ද,

ඒ උපලේඛනයේ පිළිවෙළින් II වෙනි හෝ III වෙනි තීරවල අනුරූප සටහනෙහි නිශ්චිතව සඳහන් ප්‍රමාණය බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සී. ඊ. එච්. අමරසේකර,
ආහාර පාලක සහ ආහාර කොමසාරිස්.

1970 සැප්තැම්බර් 20 වෙනි දින,
කොළඹ දීය.

උපලේඛනය

| I වෙනි තීරය | II වෙනි තීරය | | III වෙනි තීරය |
|---|---|---|---|
| පන්තිය | හාල් රාත්තල් වලින් | හෝ | වී රාත්තල් වලින් |
| ළදරුවා ... ... ... | 4 | ... | 8 |
| ළමයා ... ... ... | 4 | ... | 8 |
| සාමාන්‍ය ... ... ... | 4 | ... | 8 |
| කම්කරු ... ... ... | 4 | ... | 8 |

" රාත්තල " යනුවෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව රාත්තලේ බරය.

9–1089


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

710/7—ජේ 17146—10,975 (70/9)